ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට / විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය (II කොටස) - 2005/2006 (2007)

## (02) වාක්‍ය රචනය

පැ. තුනයි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වන අතර එම එක් එක් කොටස යටතේ විස්තර හතරක් බැගින් දී ඇත. **එක් කොටසකින් එක** විස්තරයක් තෝරා එය තේමා කොට ගෙන **වචන 350 අඩු නොවනසේ** වාක්‍ය රචනා **දෙකක්** ලියන්න. අදාළ කොටස සහිත ප්‍රශ්න අංකය ලියා උචිත මාතෘකාවක් ද යොදන්න. (උදා: II කොටස 6 ප්‍රශ්නය)

### I කොටස

1. අධ්‍යාපනයේ මූලික අරමුණ විය යුත්තේ සමාජ අසාධාරණය හෝ පන්ති පදනමේ බලපෑම ඇති නොවන පරිදි සහජ දක්ෂතා ඇති අයට හානියක් නොවන සේ සිසුන්ගේ නිපුණතා වර්ධනය සැලසෙන ආකාරයෙන් ශාස්ත්‍රදානය කිරීමයි. අධ්‍යාපනය ලැබීම හැම දරුවකු සතුව ම පවත්නා උත්තරීතර අයිතිවාසිකමකි.

(ලකුණු 33 යි)

2. විද්‍යුත් පණිවිඩවල ඉගෙනීම මෙරට දරුවන් ලැබූ වරප්‍රසාදයක් ලෙස සමහරු දකිති. ඇතැමුන්ගේ මතය වනුයේ විද්‍යුත් පණිවිඩ සඳහා සම දරුවන් කිසි දිනෙක නොයවන බවයි. පාසල් ගුරුවරුන් අතර ද විද්‍යුත් පණිවිඩ ගැන පවත්නේ විවිධ මතිමතාන්තර හා රුචි අරුචිකම් ය. කෙසේ වෙතත් විද්‍යුත් පණිවිඩ වර්තමානයේ ජනප්‍රිය ව්‍යාපාරයක් බවට පත්ව තිබේ.

(ලකුණු 33 යි)

3. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය මෙකල බොහෝ දෙනාගේ කතාබහට ලක් වූ කරුණකි. අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිරිහීම නිසා විශ්වවිද්‍යාලවලින් පිට වන උපාධිධාරීන් රැකියාවලට බඳවා ගැනීම පිළිබඳව ද ගැටලු පැන නැගී ඇත. රටේ ආර්ථික හා සාමාජික අවශ්‍යතා අනුව පාඨමාලා විවිධාංගීකරණයට හා සංශෝධනයට ලක් විය යුතු බව ද පැවසේ. මේ තත්ත්වය යටතේ උපාධි අපේක්ෂකයින්ගේ දැනුමට මෙන් ම නිපුණතා වර්ධනයට ද යෝග්‍ය වන සේ කාලීන අවශ්‍යතා අනුව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ප්‍රතිව්‍යුහගත කළ යුතු වේ.

(ලකුණු 33 යි)

4. නවක වදය ගැන අප රටේ විශ්වවිද්‍යාලවලින් ද උසස් අධ්‍යාපන ආයතන හා පාසල්වලින් ද අසන්නට ලැබේ. මේ නිසා සිසුන් මුහුණ පාන ශාරීරික හා මානසික වධහිංසා අපමණ ය. ඇතැම්හු උසස් අධ්‍යාපනය හැර දමා පෙරළා නිවෙස්වලට යති. සමහරු දිවි නසා ගනිති. තවත් කෙනෙක් අංගවිකල බවට පත් වෙති. මේ අනුව නවක වදය පිටු දැකීම උදෙසා විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතන මගින් පමණක් නොව පාසල් මගින් ද කිසියම් වැඩ පිළිවෙලක් ආරම්භ කරන්නේ නම් එය සැමගේත් පැසසුමට ලක් වේ.

(ලකුණු 33 යි)

### II කොටස

5. ගෝලීයකරණය තුළින් හෙළි වන දෙයක් නම් ලෝකයේ ප්‍රාග්ධනය හිමි සංවර්ධිත රටවල් වඩා ප්‍රාග්ධනය හීන සංවර්ධනය වන රටවල් ලෝක අර්ථ ක්‍රමය තුළ නව ආකාරයකට පෙළ ගැස්වීමයි. මේ අනුව සංවර්ධනය වන රටවල අනන්‍යතාව, සංස්කෘතික හර පද්ධතිය හා සාරධර්ම කෙරෙහි පවා බලපෑම් එල්ල විය හැකි ය. මේ තත්ත්වය වටහා ගෙන ගෝලීයකරණයට ඥානාන්විතව මුහුණ පෑම සංවර්ධනය වන රටවල අරමුණ විය යුතු ය.

(ලකුණු 34 යි)

6. මැද පෙරදිග රාජ්‍යයන් සිය අණසකට යටත් කර ගැනීම සඳහා ඇමෙරිකාව ඇතුළු ඇතැම් යුරෝපීය රටවල් ආක්‍රමණශීලී විවිධ ක්‍රියාවන්හි නිරතව සිටී. මේ වාතාවරණය යටතේ දුර්වල රාජ්‍යයන්ට සිදු වනුයේ ලෝක බලවතුන් හමුවේ නිහඬව සිටීමටයි. මේ ඛේදජනක තත්ත්වය මඟ හරවා ගැනීමට නම් ලෝකයේ දුර්වල රාජ්‍යයන් එකමුතුව හා සහයෝගයෙන් ක්‍රියා කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් වන්නේ ය.

(ලකුණු 34 යි)

EXAMMOOD.LK
EXAMMOOD.LK